**ආණමඩුව ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**
**----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**
**--------------------------------**

සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 10 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

**1.2 මතය**
**-------**

මෙම වාර්තාවේ 1.3 ඡේදය දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ආනමඩුව ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**--------------------------------------**

**1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**
**----------------------**

පහත සඳහන් කරුණු විගණනයේ දී අනාවරණය විය.

(අ) වරිපනම්, කුලී , බදුකුලී, අක්කර බදු, විශ්‍රාම වැටුප් හා සම්ප්‍රේෂණ කුළුණු වැනි ආදායම් උපචිත පදනම මත ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**
**---------------------**

විගණනයේ දී පහත කරුණු අනාවරණය විය.

(අ) පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.12,949 ක් වටිනා පුස්තකාල පොත්වල වටිනාකම ඇතුලුව වත්කම් 05 ක වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) වර්ෂ අවසානයේ ඉතිරිව පැවති රු.90,407 ක් වූ නල ළිං උපකරණ තොගය ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) පෙර වර්ෂයේදී පුද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබූ රු.217,081 ක අත්තිකාරම් මුදලක් අත්තිකාරම් ලෙස ගිණුම් ගත කර නොතිබූ අතර, එම මුදල සමාලෝචිත වර්ෂය තුළ පියවීමේදී සමුච්චිත අරමුදලට බැරකරනු වෙනුවට අදාළ වැය විෂයයන්ට බැර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) වර්ෂයේ ආදායම් බිල්කිරීම් නිසි පරිදි ගිණුම්වලට ගැලපීම් නොකිරීම නිසා ආදායම් විෂයයන් 04 කට අදාලව ආදායම රු.960,763 ක් අඩුවෙන් ද, එක් ආදායම් විෂයයකට අදාලව වර්ෂයේ ආදායම රු.28,229 ක් වැඩියෙන් ද දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල් රු.81,624 ක් සඳහා මුල්‍ය ප්‍රකාශනවල වෙන්කිරීම් සිදුකර නොතිබීමෙන් එම වටිනාකමින් වර්ෂයේ වියදම් සහ ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ගිණුම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) 2013 වර්ෂයේ IV වන කාර්තුව සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මුද්දර බදු රු.30,520 ක් නිසි පරිදි ගිණුම්ගත නොකිරීම නිසා වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද ගෙවිය යුතු මුද්දර බදු ගිණුම් එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද දක්වා තිබුණි.

(උ) වර්ෂයේ මුලධන ආධාර සහ මූලධන ආධාර ණයගැතියන් රු. 898,445 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) 2013 වර්ෂයේ III වන කාර්තුවට අදාළව එකතුකල අගය මත බදු මුදල වූ රු.127,612 ක් ජාතිය ගොඩනැඟිමේ බදු ගිණුමෙහි ගිණුම්ගතකර තිබීමෙන් එම වටිනාකමින් ගෙවිය යුතු එකතුකල අගය මත බදු ගිණුම වැඩියෙන්ද ගෙවිය යුතු ජාතිය ගොඩනැඟිමේ බදු ගිණුම අඩුවෙන් ද දක්වා තිබුණි.

(එ) එකතුකල අගය මත බදු ලැබීම් රු.39,140 ක් ජාතිය ගොඩනැඟිමේ බදු ලැබීමක් ලෙස සටහන් කිරීමෙන් ගෙවිය යුතු එකතුකල අගය මත බදු ගිණුම එම වටිනාකමින් අඩුවෙන්ද ගෙවිය යුතු ජාතිය ගොඩනැඟිමේ බදු ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද දක්වා තිබුණි.

(ඒ) ආපසු ගෙවිය යුතු තැන්පතු ගිණුමට බැරකළ යුතු තැන්පතු රු.1,070,951 ක් සමුච්චිත අරමුදලට බැර කිරීම හේතුවෙන්, ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂය අඩුවෙන්ද සමුච්චිත අරමුදල වැඩියෙන්ද දක්වා තිබුණි.

(ඔ) ණය හිමියන් වැඩියෙන් ගණනය කිරීම නිසා විවිධ ණය හිමි ගිණුම සහ වර්ෂයේ වියදම් රු.64,800 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඕ) හිඟ අක්කර බදු රු.25,095 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබීමෙන් එම වටිනාකමින් වර්ෂයේ ආදායම් සහ හිඟ හිටි අක්කර බදු ගිණුම අඩුවෙන් දක්වා තිබුණි.

(ක) 2013 නොවැම්බර් හා දෙසැම්බර් මාසවලට අදාළ සම්ප්‍රේෂණ කුළුණු සඳහා වූ රු.92,302 ක ආදායම් වෙනුවෙන් ගිණුම්වල ගැලපුම් නොකිරීම නිසා වර්ෂයේ ආදායම් හා ආදායම් ණයගැතියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ග) 2013 වර්ෂයේ ජනවාරි සිට මැයි දක්වා එකතු කළ වටිනාකම රු. 20,293 ක්වූ ජාතිය ගොඩනැඟිමේ බදු ගිණුමේ අවසන් ශේෂය සමුච්චිත අරමුදලට ගලපා තිබීම නිසා, ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදුවල වටිනාකම රු.20,293 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

**1.3.3 නොසැසඳු පාලන ගිණුම්**

ගිණුම් විෂයයන් 03 ක එකතුව රු. 34,595,074 ක් වුවද, පොදු ලෙජරය අනුව අදාල ශේෂයන්ගේ එකතුව රු. 31,899,739 ක් වූයෙන් රු. 2,695,335 ක නොසැසඳුන ශේෂයක් අනාවරණය විය.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම**

**----------------------------------------**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 80,147,722 ක් වූ ගනුදෙනු සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**-------------------------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**---------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,288,151 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.4,818,402 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**---------------------**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

**-----------------------------------------------------------**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| **ආදායම් විෂයය** | | **ඇස්තමේන්තුගත ආදායම** | **තථ්‍ය ආදායම** | **දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය** |
|---|---|---|---|---|
| --------------- | | --------------- | -------- | -------------- |
| | | රු. **'000** | රු. **'000** | රු. **'000** |
| (i). | වරිපනම් හා බදු | 1,919 | 1,048 | 871 |
| (ii). | බදුකුලී, කඩකුලී | 6,701 | 6,606 | 95 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 950 | 964 | (14) |

2.2.2 වරිපනම් බදු

------------

හිඟ වරිපනම් බදු අයවීම මෙන්ම, බිල්කල ආදායම අයවීමද වර්ෂය තුළ සැළකිය යුතු මට්ටමක නොවූ අතර, පෙර වර්ෂවල හිඟ මුදලට වර්ෂයේ හිඟය එකතුවීමෙන් රු.3,082,479 ක වරිපනම් හිඟ ආදායමක් දක්නට ලැබුණි.

2.2.3 දේපල බදු

-----------

නව බස් නැවතුම්පල කඩ කාමර 5 ක් සඳහා බිල්කල මුදල වූ රු.100,600 කින් කිසිදු මුදලක් 2014 වර්ෂයේ මැයි මස දක්වා අයකර ගෙන නොතිබුණි.

**2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**----------------------------**

ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 4,361,160 ක උසාවි දඩ හා මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.4 **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්**

**-----------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂාවල දී අනාවරණය වූ පරිදි සභාව සතුව පැවති රු. 597,668 ක් වටිනා රෝද හතරේ ට්‍රැක්ටරයක්, වටිනාකම ගණනය නොකළ තවත් ට්‍රැක්ටරයක් හා උපකරණ 03 ක් වසර 01 සිට වසර 05 අතර කාලයක් තිස්සේ නිෂ්ක්‍රීයව පැවතුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**-----------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 සැප්තැම්බර් 30 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල වටිනාකම රු.5,309,180 ක් වූ අතර, එයින් සේවකයින් 20 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබූ රු.39,867 ක් වූ ණය අත්තිකාරම් වර්ෂ ගණනාවක් තිස්සේ අය නොවී හිඟ හිට තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී ආණමඩුව, පල්ලම හා මහකුඹුක්කඩවල මහජන පුස්තකාලවලින් පොත් අස්ථානගතවී තිබීමෙන් සභාවට රු. 32,567 ක අලාභයක් සිදුව තිබූ අතර එම අලාභය වගකිව යුත්තන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.2 කාර්ය සාධනය**

**----------------**

2013 වර්ෂයේ දී සභා අරමුදලින් ඉටුකිරීමට යෝජිතව තිබූ රු.3,670,000 ක් වටිනා ප්‍රාදේශීය සංවර්ධන කටයුතු 08 ක් සිදුකිරීමට සභාව අපොහොසත්ව තිබූ අතර, ඒ වෙනුවෙන් සළසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරිව තිබුණි.

**4. පද්ධති හා පාලන**

**------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් කළමනාකරණය
(ඈ) ණයගැති හා ණයහිමි පාලනය
(ඉ) වත්කම් කළමනාකරණය